www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව පැරා-මිලිටරි නායකයකු නැගෙනහිර මහ ඇමති ලෙස පත් කරයි

## Sri Lankan government installs paramilitary leader as chief minister in the East

**කේ. රත්නායක විසිනි**
**2008 මැයි 19**

මැයි 10 දා නැගෙනහිර පලාත් සභාව සඳහා පැවති මැතිවරනය එම "මුදාගත්" පලාතට ප්‍රජාතන්ත්‍රවාදය යලි ගෙන ඒමක් නියෝජනය කරන බවට ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ කරන කියාපෑම ප්‍රෝඩාවකි. එම ඡන්ද විමසීම වනාහි 20,000ක හමුදා භටයන් හා සෙසු මිලිටරි නිලධාරින් මෙන් ම 27,000ක පොලිස් බල ඇනියක් ද යෙදවීම මධ්‍යයේ සිදු වූ ඡන්ද දූෂනවලින්, බියගැන්වීම්වලින් හා මැර ක්‍රියාවන්ගෙන් සමන්විත අභ්‍යාසයකි.

නව පලාත් සභා තන්ත්‍රයේ ස්වභාවය පිලිබඳ පැහැදිලි ම දර්ශකය වූයේ, පසුගිය සිකුරාදා පිල්ලෙයාන් නමින් ද ප්‍රකට එස්. චන්ද්‍රකාන්තන් එහි මහ ඇමති ලෙස පත් කිරීම යි. පිල්ලෙයාන් යනු දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ 2004 දී හටගත් භේදයකින් පසුව පිහිටුවන ලද තමිල් මක්කල් විඩුතලෙයි පුලිහල් (ටීඑම්වීපී) නම් කුප්‍රකට පැරා මිලිටරි කන්ඩායමක නායකයා ය.

එල්ටීටීඊයට එරෙහිව යලි අරඹන ලද යුද්ධයේ දී මිලිටරිය සමග සමීප සහයෝගයකින් ක්‍රියා කර ඇති ටීඑම්වීපී සංවිධානයට පැහැර ගැනීම්, ලමා සොල්දාදුවන් බලහත්කාරයෙන් බඳවා ගැනීම්, අතුරුදහන් වීම් හා ඝාතන සම්බන්ධයෙන් පුලුල් වසයෙන් චෝදනා එල්ල වී තිබේ. එහෙත් රාජපක්ෂගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) ටීඑම්වීපී සමග සන්ධානයක් තනා ගත් අතර ඔහුගේ ආන්ඩුව මෙම සන්නද්ධ කන්ඩායම නිරායුධ කරන ලෙස විපාර්ශ්වික පක්ෂ කල ඉල්ලීම් නොතකා හැරියේ ය.

මැතිවරන නිරීක්ෂන කන්ඩායම් දෙකක් ම -- නිදහස් හා සාධාරන මැතිවරනයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (පැෆරල්) සහ මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා නිරීක්ෂන මධ්‍යස්ථානය (සීඑම්ඊවී) -- බියගැන්වීම් හා ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ සිද්ධීන් වාර්තා කර ඇත. පැෆරල් සංවිධානය ශාරීරික පහරදීම් පිලිබඳ සිද්ධීන් 14ක් ද ඡන්ද මධ්‍යස්ථාන 21කින් විපාර්ශ්වික නියෝජිතයන් පලවා හැරීම ඇතුලු "බරපතල සිද්ධීන්" ගනනාවක් ම වාර්තා කලේ ය. බොහෝ පැමිනිලි වාර්තා කෙරුනේ ටීඑම්වීපී සංවිධානයට එරෙහිව ය. සීඑම්ඊවී "බරපතල වැරදි" සහිත සිද්ධීන් 48ක් ඇතුලු මැතිවරන දූෂන සිද්ධීන් 64ක් වාර්තා කලේ ය.

මැතිවරන ව්‍යාපාරයේ කාල පරිච්ඡේදය තුල දී සමස්ත ඇමති මන්ඩලය ම පාහේ පාලත තුල කඳවුරු බැඳ ගනිමින්, රාජපක්ෂ ආන්ඩුව මැතිවරනය වෙනුවෙන් හැකි සියලු ම සම්පත් යෙදවූයේ ය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉහල නිලධාරින් ගනනාවක් සහ ආධාරකරුවන් සිය ගනනක් වරාය කටයුතු කර ගෙන යාම යන කඩතුරාව යටතේ මැතිවරන වේදිකා ඉදිකිරීමේ යෙදුනු බව අම්පාරේ සිටින ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ආධාරකරුවෙක් පැහැදිලි කලේ ය. සෙසු ඇමතිවරු වසර ගනනාවක් තිස්සේ මාරුවීම් බලාපොරොත්තුව සිටි ගුරුවරුන්ට මාරුවීම් ලබා දෙන බවටත් රෝහල් සේවක රැකියා ලබා දෙන බවටත් පොරොන්දු වූහ.

ලැජ්ජා විරහිත ලෙස ආන්ඩුවේ සම්පත් පරිහරනය කිරීම සහ විපක්ෂය බියගැන්වීමේ ප්‍රයත්න තිබිය දී ම, එජනිස-ටීඑම්වීපී සන්ධානයට මැතිවරනය ජයගත හැකි වූයේ යන්තමිනි -- එනම්, එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (ශ්‍රීලමුකො) ලබාගත් ඡන්ද 250,732ට සන්සන්දනාත්මකව ඡන්ද 308,886ක් ලබා ගනිමිනි. එජනිස, පලාතේ දිස්ත්‍රික්ක තුනෙන් එකක් වන ත්‍රිකුනාමලයේ දී විපක්ෂයට පරාජය විය.

සමස්තයක් වසයෙන් ගත් කල, මුස්ලිම් වාර්ගික පක්ෂ දෙකක් ද -- ජාතික කොංග්‍රසය සහ සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය -- ඇතුලත් වූ පාලක සභාගය සෘජුව ආසන 18ක් දිනා ගත් අතර වැඩිම ඡන්ද ප්‍රමානය ලබා ගැනීම වෙනුවෙන් ප්‍රසාද ආසන දෙකක් ද එයට ලැබුනි. දෙමල ජාතික ප්‍රජාතන්ත්‍ර සන්ධානය (ටීඩීඑන්ඒ) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ඇතුලු විපාර්ශ්වික පක්ෂ ආසන 17ක් දිනා ගත්තේ ය.

නැගෙනහිර දී එය ලද "ජයග්‍රහනයෙන්" සතියක් ඉක්ම යාමට මත්තෙන්, තනතුරු බෙදා ගැනීම අරබයා හටගත් දරුනු අභ්‍යන්තර ගැටුමක් මධ්‍යයේ පාලක සන්ධානය බිඳ වැටීමට පටන් ගෙන තිබේ. ටීඑම්වීපී සංවිධානයට වඩා වැඩි ආසන සංඛ්‍යාවක් ලබා ගැනීමට මුස්ලිම් පක්ෂ සමත් වුව හොත් තමාට මහ ඇමති තනතුර ලබා දීමට රාජපක්ෂ පොරොන්දු වී තිබුනු බවට සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසයේ නායක එම්.එල්.ඒ.එම්.

හිස්බුල්ලා කියාපෑමෙන් පසුව එම පක්ෂය සභාගයෙන් ඉවත් විය.

මතභේදවලට පැලැස්තරයක් දමා ගැනීමට උත්සාහ කිරීමෙන් පසුව, රාජපක්ෂ අවසානයේ පිල්ලෙයාන් මහ ඇමති ලෙස පත් කලේ, හිස්බුල්ලා වෙතින් කෝපාවිෂ්ට ප්‍රතිචාරයක් අවුලුවාලමිනි. ජනාධිපති "මුස්ලිම් ජනතාව පාවා දී" ඇතැයි ඔහු චෝදනා කලේ ය. හිස්බුල්ලා ඊයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයට මෙසේ පැවසී යඃ "ජනාධිපතිතුමා අපට පැවසූ එකම දෙය නම් යුද්ධය ඉක්මනින් අවසන් කිරීමට ඔහුට අවශ්‍ය බව යි, එබැවින් පිල්ලෙයාන් මහ ඇමති කිරීම අවශ්‍ය බව යි."

රාජපක්ෂගේ තීන්දුව, නැගෙනහිර පලාතේ විරුද්ධත්වය මැඩීමට පමනක් නොව, උතුරේ මිලිටරිය ගෙනයන මෙහෙයුම්වලට සහයෝගය පිනිස ද ටීඑම්වීපී සංවිධානයේ සන්නද්ධ මැරයන් අඛන්ඩව යොදා ගැනීම ආන්ඩුවේ අභිප්‍රාය බවට කෙරෙන තර්ජනාත්මක අනතුරු ඇඟවීමකි. සභිකයන් තිදෙනෙකුගෙන් යුත් සිය කන්ඩායම පලාත් සභාව තුල ස්වාධීන කන්ඩායමක් තනන බවට හිස්බුල්ලා නිවේදනය කලේ ය. එමගින් එජනිස-ටීඑම්වීපී සන්ධානය ආසන 17ක සුලුතරයක් බවට පත් කෙරෙනු ඇත.

සෙනසුරාදා, හිස්බුල්ලාගේ ආධාරකරුවෝ ඔහුගේ බල කඳවුර වන කාත්තන්කුඩි ප්‍රදේශයේ හර්තාලයක් කැඳවූහ. ඊයේ සන්ඩේ ටයිම්ස් මෙසේ සටහන් කලේ යඃ "සමහර වෙලඳ සැල් විරෝධය පෑමක් ලෙස වසා තිබුනි. එහෙත් සවස් වරුව වන විට, ටීඑම්වීපී කාඩර්වරු සමග පැමිනි හමුදා බල ඇනි කාත්තන්කුඩිවලට ඇතුලු වී වෙලඳ සැල් ව්‍යාපාරික කටයුතු සඳහා යලි විවෘත කරන ලෙස අන කලේ ය. බොහෝ විට එය නව මහ ඇමතිගේ ප්‍රථම ක්‍රියාවන්ගෙන් එකක් විය හැකි ය."

පලාතේ ඉහල ම තනතුර අරබයා හිස්බුල්ලා සහ පිල්ලෙයාන් අතර හටගත් මතභේදය සමස්ත ව්‍යාපාරයේ ම වාර්ගික ස්වභාවය අවධාරනය කරයි. 2004 දී ටීඑම්වීපී එල්ටීටීඊයෙන් භේද වූයේ "උතුරේ" එල්ටීටීඊ නායකයන් නැගෙනහිර එල්ටීටීඊ සටන්කරුවන්ට වෙනස්කම් කරන බවට කෙරුනු දරුනු චෝදනා මධ්‍යයේ ය. නැගෙනහිර පලාතේ දෙමල ප්‍රභූවේ කොටස්වලට වරප්‍රසාදිත තත්වයක් සහතික කර ගැනීමේ බලාපොරොත්තුවෙන් යුතුව, ටීඑම්වීපී ආන්ඩුව සහ මිලිටරිය සමග සහයෝගයෙන් ක්‍රියා කර තිබේ. සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසයට තමන් රවටනු ලැබ ඇති බවට හැඟෙන්නේ, මුස්ලිම් ප්‍රභූවේ කොටස්වලට තනතුරු වරප්‍රසාද නොලැබෙනු ඇති නිසා ය. සමස්ත ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරන්නේ ඔවුන්ගේ අවශ්‍යතා ය.

## යුද්ධය ඉදිරියට ගෙන යාම

මැතිවරනයෙන් ඉක්බිතිව, රාජපක්ෂ කියාපෑවේ තමන්ට "ත්‍රස්තවාදය පරාජය කිරීම මගින් සාමය ගොඩනැගීම, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සහ රට සංවර්ධනය කිරීම පිනිස පැහැදිලි ජනවරමක්" ලැබුනු බව යි. ඔහුගේ ප්‍රකාශ මගින් පැහැදිලිව ම තහවුරු කෙරෙන්නේ, ඉක්මන් ජයග්‍රහනයක් සඳහා වූ මිලිටරියේ සැලසුම් ලද පසුබෑසීම් තිබිය දී ම, එල්ටීටීඊයට එරෙහිව එය යලි ඇරඹූ යුද්ධය ඉදිරියට තල්ලු කිරීම ආන්ඩුවේ අභිප්‍රාය බව යි.

ඊට සමාන මනෝගතියකින් යුක්තව, ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මැයි 12 දා අයිලන්ඩ් පත්‍රයට පැවසුවේ, "ආන්ඩුවේ හා ටීඑම්වීපීයේ සන්ධානයට ලැබුනු පහසු ජයග්‍රහනය වන්නියේ මිලිටරි ව්‍යායාමයට අතිමහත් තල්ලුවක් වනු ඇති" බව යි. මෙම "පෙර නොවූ විරූ ජයග්‍රහනය . . . සතුරාගේ වන්නි බලකොටුව බිඳවැටීම නිශ්චිතව ම ඉක්මන් කරනු ඇති" බවට ඔහු පුරසාරම් දෙඩී ය.

යුද්ධය නැගෙනහිරට සාමය, ප්‍රජාතන්ත්‍රවාදය සහ සංවර්ධනය ගෙනවිත් ඇති බවට කරන කියාපෑම් විකාරයකි. පලාතේ එල්ටීටීඊ බල මධ්‍යස්ථාන පෙරලා දමනු වස් නැගෙනහිර එල්ටීටීඊ සංවිධානය තුල හටගත් භේදය ගසාකෑමට මිලිටරියට හැකි විය. යුද ගැටුම්වල දී 4000ක් පමන ඝාතනයට ලක්ව තවත් 200,000කට වැඩි පිරිසක් අවතැන් විය. බොහෝ දෙනෙක් තවමත් ජරාජීර්න සරනගත කඳවුරුවල ජීවත් වන අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙකුට මෙවර මැතිවරනයේ දී ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි විය.

යුද්ධයටත් ජීවන මට්ටම් මත එහි බලපෑමටත් විරුද්ධ පුලුල්ව පැතිරුනු වෛරයක් රට පුරා පවතී. ජාත්‍යන්තර වෙලඳ පොලේ ආහාර හා තෙල් මිල ගනන් නැගීම සමග සම්බන්ධිතව, දැවැන්ත මිලිටරි වියදම්වල බලපෑම යටතේ මූලික ද්‍රව්‍යවල මිල ගනන් අහස උසට නැග තිබේ. ආන්ඩුව, සිය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" නාමයෙන්, වැටුප් වැඩි කිරීම ප්‍රතික්ෂේප කොට, සමාජ සේවා සඳහා වන වියදම් කප්පාදු කොට, තථ්‍ය වසයෙන් ම වාරනයක් පනවා, නඩු නොමැතිව දින නියමයක් නැතිව පුද්ගලයන් රඳවා ගැනීමට ඉඩ සලසන පුලුල් හදිසි නීති බලතල පවත්වා ගෙන විත් තිබේ.

විපාර්ශ්වයේ එකදු පක්ෂයක් වත් යලි ඇරඹූ යුද්ධයට විරුද්ධ වී නැත. 1983 දී යුද්ධය දියත් කල එජාපය ද රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන් ම සිංහල ස්වෝත්තමවාදයේ ගිලී පවතී. ආන්ඩුව අයවැය ඡන්දයෙන් පරාජයට පත්ව බිඳ වැටෙනු ඇතැයි විශ්වාස කරමින් පසුගිය දෙසැම්බරයේ දී එයින් ඉවත්

වන තෙක් ම ශ්‍රීලමුකො රාජපක්ෂගේ පාලක සභාගයේ කොටසක් විය. පලාත් සභා මැතිවරනයෙන් අනතුරුව, එජාප-ශ්‍රීලමුකො සන්ධානය ආන්ඩුවේ මැතිවරන “මංකොල්ලයට” එරෙහිව සීමිත විරෝධතා ව්‍යාපාරයක් නිවේදනය කලේ ය.

අර්ථභාරී කරුනක් නම්, වඩා ආක්‍රමනශීලී ලෙස යුද්ධය ගෙන යා යුතු යැයි ඉල්ලා සිටි ජවිපෙට ලබා ගත හැකි වූයේ ඡන්ද 9,390ක් හා එක අසුනක් පමනක් වීම යි. 2006 පලාත් පාලන මැතිවරනයේ දී නැගෙනහිර පලාතේ දී එය ලද ප්‍රතිඵල හා සැසඳු කල එහි ඡන්ද ප්‍රමානය 10,000කින් කඩා වැටී තිබේ. එහි සහයෝගී පදනම් බිඳ වැටීම, ආන්ඩුවට වඩා විවෘතව සහයෝගය දෙනවා ද නැද්ද යන්න මත ජවිපෙ සංවිධානය තුල ව්‍යසනකාරී භේදයක් අවුලුවා ඇත. පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශගේ නායකත්වයෙන් යුක්ත භේද වූ කන්ඩායමක්, ආන්ඩුවට සහයෝගය නොදීමෙන් වරදක් කර ඇති බව කියමින්, පසුගිය සතියේ දී ජාතික නිදහස් පෙරමුන (ජානිපෙ) නමින් නව පක්ෂයක් තැනී ය.

ජවිපෙ, අනෙක් අතින්, වඩා විවේචනශීලී ආකල්පයක් ගැනීම මගින් සිය සහයෝගී පදනම් පිලිසකර කර ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටී. නැගෙනහිර මැතිවරනයේ දී” ආන්ඩුවේ අනුග්‍රහය ලද මැරයන් විසින් වංචා, හොර ඡන්ද දැමීම් හා ප්‍රචන්ඩ ක්‍රියා මුදා හැරීම “සිදු කල බවට ජවිපෙ නායකයෝ ආන්ඩුවේ පක්ෂවලට චෝදනා කලහ. එමෙන් ම, ඉන්දියාවේ බලකිරීමට යටත් වී මැතිවරනය පැවැත් වූ බවට ආන්ඩුවට චෝදනා කරමින්, දෙමල විරෝධී අන්තවාදය ඇවිලවීමට ද ජවිපෙ උත්සාහ කර තිබේ. පිල්ලෙයාන් මහ ඇමති ලෙස පත් කිරීමෙන් පසුව, ජවිපෙ නායක විජිත හේරත් ඔහු “ඉන්දියානු ඒජන්තයකු” බවට හංවඩු ගැසී ය.

නැගෙනහිර මැතිවරන ප්‍රතිඵලය, දිවයිනේ 25 අවුරුදු ම්ලේච්ඡ වාර්ගික යුද්ධය විසඳලනු පිනිස සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතයේම නොහැකියාව පිලිබඳ තවත් එක් දර්ශකයකි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, උතුරේ මිලිටරි හිරවීම බිඳිනු වස් කෙරෙන තවත් යුද ව්‍යායාමයක දී තවත් බොහෝ ජීවිත බිලි දෙන බවට ජනාධිපති දී ඇති ප්‍රතිඥාවක් සමග ම පැරා-මිලිටරි මැරයකුගේ නායකත්වයෙන් යුක්ත නැගෙනහිර පාලන තන්ත්‍රයකි.

© www.wsws.org